# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1949/29 - 2016 ජනවාරි මස 12 වැනි අඟහරුවාදා - 2016.01.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙම නියෝගය මගින් එකී පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවන ලද 2015.11.20 වැනි දිනැති අංක 1941/29 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයෙහි II වන උපලේඛනය, පහත උපලේඛනය පරිදි සංශෝධන කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

1. 2015.11.20 දිනැති අංක 1941/29 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* II වන උපලේඛනයෙහි අයිතම 1 ට පෙර පහත සඳහන් අයිතමයන් ඇතුළත් කරමි.

| *අංකය*<br>I | *විස්තරය*<br>II | *නිෂ්පාදන බද්ද*<br>III |
|---|---|---|
| 1 | (අ) ආනයනය කරනු ලබන මෝටර් රථ,<br>(අ) රාජ්‍ය සේවකයෙකු විසින් 1999.10.08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා එයට යා කරන ලද සංශෝධනවලට අනුකූලව ; සහ<br>(ආ) රාජ්‍ය සේවකයෙකු විසින් 2013.08.02 දිනැති අංක 01/2013 දරන වෙළඳ තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය හා එයට යා කරන ලද සංශෝධනවලට අනුකූලව ; | 2015.02.26 දිනැති අංක 1903/39 දරන ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් ගෙවිය යුතු බදු ප්‍රමාණයන් |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය I

| අංකය<br>I | | විස්තරය<br>II | නිෂ්පාදන බද්ද<br>III |
|---|---|---|---|
| | | 2015.11.20 දින හෝ ඊට පෙර සහනදායි බලපත්‍ර නිකුත් කරන ලද සහ 2015.12.31 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කරන ලද සඳහා | |
| | (ආ) | ආනයනය කරනු ලබන මෝටර් රථ<br>2015.09.11 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කරන ලද 2006 අංක 11 දරන මුදල් පනතේ 2 වගන්තියෙහි (1) හි (ආ) (i) සහ (ii) වගන්ති සහ කලින් කලට කරනු ලබන සංශෝධන යටතේ සලසා ඇති ප්‍රතිපාදන අනුව සුදුසුකම් ලබන තනිපුද්ගල බදු ගෙවන්නකු සඳහා | 2015.02.26 දිනැති අංක 1903/39 දරන ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් ගෙවිය යුතු බදු ප්‍රමාණයන් |
| | (ඇ) | ආනයනය කරනු ලබන මෝටර් රථ<br>2015.11.20 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කර සහ එම වාහනය 2016.03.31 දින හෝ ඊට පෙර පුද්ගලික පරිහරණය සඳහා ආනයනය කරන ලද පුද්ගලයාගේ නමින් ලියාපදිංචි කරන ලද සහ නිෂ්කාශනය කරනු ලබන වාහන මුල් ලියාපදිංචි දිනයේ සිට වසර පහක් (05) ක් ගත වන තුරු අන් අයෙකුට පැවරිය නොහැකි ලෙස | 2015.02.26 දිනැති අංක 1903/39 දරන ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් ගෙවිය යුතු බදු ප්‍රමාණයන් |

2. 2015.11.20 දිනැති අංක 1941/29 දරන ගැසට් නිවේදනයේ උපලේඛනය II හි සඳහන් අංක 1 සිට 3 දක්වා අයිතමයන් අංක 2 සිට 4 දක්වා ප්‍රතිඅංකනය කිරීම.

02 - 150